UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - AUGUST 2015
ශාස්ත්‍රවේදි සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - අගෝස්තු 2015

දේශපාලන විද්‍යාව/Political Science (PSG: I)

**දේශපාලන සහ සමාජ න්‍යාය**

සැම ප්‍රශ්නයකටම සමාන ලකුණු සංඛ්‍යාවක් ලැබේ.
මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
කාලයඃ පැය **තුනයි.**

---

01. "ඇරිස්ටෝටල්ගේ ආණ්ඩුක්‍රම වර්ගීකරණය පදනම් වී ඇත්තේ පාලන බලය දරන පුද්ගල සංඛ්‍යාව සහ ඔවුන්ගේ පාලනයේ ගුණාත්මක බව මතය." සාකච්ඡා කරන්න.

02. "රූසෝ විසින් ඉදිරිපත් කරන ලද සමාජ ගිවිසුම ලොක්ගේ සමාජ ගිවිසුමට වඩා සම්පූර්ණයෙන්ම වෙනස්ය." ඔබ එකඟවන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

03. ජෝන් ඔස්ටින් ස්වාධිපත්‍ය පිළිබඳ ඉදිරිපත් කළ අදහස් විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

04. "නිදහසෙන් තොර සමානාත්මතාවය හෝ සමානාත්මතාවයෙන් තොර නිදහස අර්ථශූන්‍ය වේ." මෙම ප්‍රකාශය විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

05. අ) ලිබරල්වාදය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

ආ) සම්භාව්‍ය හා නව ලිබරල්වාදය අතර ඇති වෙනස්කම් හඳුන්වන්න.

06. කාල් මාර්ක්ස් විසින් ඉදිරිපත් කරන ලද අතිරේක වටිනාකම් න්‍යාය හා පංති අරගලය පිළිබඳ විවේචනාත්මක රචනයක් ලියන්න.

07. "ෆැසිස්ට්වාදය වනාහි පුද්ගලවාදය, ලිබරල්වාදය හා ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි ප්‍රතික්‍රියාවකි." ඔබ එකඟවන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

08. මොන්ටෙස්ක්‍යු ප්‍රකාශ කළ ආකාරයට "බලය එක් පුද්ගලයෙක් හෝ ආයතනයක් වෙත කේන්ද්‍රගතවීමේ ප්‍රතිඵලය විය හැක්කේ දූෂ්‍ය පාලනයක් වන අතර එය පුද්ගල නිදහස ප්‍රතික්ෂේප කරයි." නූතන රාජ්‍යයන් සම්බන්ධයෙන් මෙය කොතෙක් දුරට සත්‍යයක්ද?

අ.පි.බ.

09. මානව අයිතිවාසිකම් පිළිබඳ පහත සඳහන් න්‍යායන් සැකෙවින් විස්තර කරන්න.

i) ඓතිහාසික න්‍යාය
ii) නීතිමය න්‍යාය
iii) ස්වාභාවික න්‍යාය
iv) විඥානාත්මක න්‍යාය

10. පහත සඳහන් මාතෘකා අතුරින් <u>දෙකක්</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ) ශ්‍රේණි සමාජවාදය.
ආ) කාර්ල් මාර්ක්ස්ගේ ද්වන්දාත්මක භෞතිකවාදය.
ඇ) ප්ලේටෝගේ ජනරජය.
ඈ) කෞටිල්‍යාගේ අර්ථ ශාස්ත්‍රය.
(ඉ) සමානාත්මතාවය සහ සම සාධාරණත්වය

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - AUGUST 2015
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - අගෝස්තු 2015

දේශපාලන විද්‍යාව/Political Science (PSG: II)
ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමය

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු සංඛ්‍යාවක් ලැබේ.
මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
ප්‍රශ්න **05කට පමණක්** පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
කාලයඃ පැය **තුනයි.**

---

01. "ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය සැබැවින්ම මධ්‍යම පාන්තික ව්‍යාපාරයක් විය". ඉහත ප්‍රකාශය සම්බන්ධයෙන් ඔබ එකඟවන්නෙහිද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

02. පහත සඳහන් මාතෘකා අතුරින් **ඕනෑම එකක්** බලපෑම පරීක්ෂා කරන්න.

    (i) කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ
    (ii) 1931 සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කිරීම.

03. සෝල්බරි ව්‍යවස්ථාවෙහි ඇතුළත් සුළුතර අයිතිවාසිකම්වල සඵලතාව (effectiveness) පරීක්ෂා කරන්න.

04. සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ පහත සඳහන් ආයතනවල ව්‍යවස්ථානුකූල තත්වය සසඳමින් වෙනස දක්වන්න.

    (i) නාමික විධායකය.
    (ii) ව්‍යවස්ථාදායකය.

05. ශ්‍රී ලංකාවේ ශක්තිමත් විරුද්ධ පක්ෂයක් වර්ධනය වීමට අවහිර කර තිබෙන සාධක පරීක්ෂා කරන්න.

06. 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්හි ඇතුළත් මූලික අයිතිවාසිකම් පිළිබඳ විධිවිධාන සසඳමින් වෙනස්කම් දක්වන්න.

07. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හඳුන්වා දෙන ලද සමානුපාතික නියෝජන ක්‍රමයේ ප්‍රධාන දුර්වලතා සාකච්ඡා කරන්න.

අ.පි.බ.

08. 1978 දෙවන සමූහාණ්ඩු ව්‍යවස්ථාවට සිදුකරන ලද 19 වන සංශෝධනයෙන් පසුව ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාගේ තත්වය, බලතල සහ කාර්යයන් විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

09. "1978 දෙවන සමූහාණ්ඩු ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ වෙසට්මින්ස්ටර් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම ආකෘතියෙන් නිශ්චිත ලෙසින් වෙන්වීමක් සලකුණු කරයි" යන මතය සමඟ ඔබ එකඟවන්නෙහිද?

10. පහත සඳහන් **ඕනෑම මාතෘකා දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) 2015 වසරේ පැවති ජනාධිපතිවරණය

(ii) 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ අග්‍රාණ්ඩුකාරවරයා

(iii) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක කාරක සභා ක්‍රමයේ ක්‍රියාකාරීත්වය

(iv) ශ්‍රී ලංකාවේ අධිකරණයේ ස්වාධීනත්වය

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - AUGUST 2015
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - අගෝස්තු 2015

දේශපාලන විද්‍යාව/Political Science (PSG: III)

**රාජ්‍ය පරිපාලන විද්‍යාව**

සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු සංඛ්‍යාවක් ලැබේ.
මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.
කාලයඃ පැය **තුනයි.**

---

01. "රාජ්‍ය පරිපාලනය" යන්න නිර්වචනය කොට රාජ්‍ය පරිපාලනය සහ පෞද්ගලික පරිපාලනය අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

02. "රාජ්‍ය පරිපාලනයට පැවැතිය හැක්කේ දේශපාලන පරිසරයක් පමණි." සාකච්ඡා කරන්න.

03. පහත සඳහන් **ඕනෑම එකක්** පිළිබඳ කෙටි රචනයක් ලියන්න.

    (අ) රාජ්‍ය පරිපාලනය අධ්‍යයනයේදී යොදා ගැනෙන සමාජ විද්‍යාත්මක ප්‍රවේශණ මාර්ගය.
    (ආ) රාජ්‍ය පරිපාලනයේ කලාව සහ විද්‍යාව.
    (ඇ) හැසිරවීමේ ප්‍රමාණය පිළිබඳ මූලධර්මයේ වාසි සහ අවාසි.

04. සංවිධානය පිළිබඳ න්‍යායට, එල්ටන් මේයෝගේ දායකත්වය පිළිබඳ විවේචනාත්මක ඇගයීමක් කරන්න.

05. මැක්ස් වෙබර්ගේ නිලබල ක්‍රමය පිළිබඳ පරමාදර්ශී න්‍යායයේ මූලික ලක්ෂණ විස්තර කොට, නූතන පරිපාලන සන්දර්භය තුළ එහි ප්‍රායෝගිකත්වය විභාග කරන්න.

06. ශ්‍රී ලංකාවේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී විකේන්ද්‍රණීය පරිපාලනය, වඩාත් යෝග්‍ය ක්‍රමවේදය ලෙස පිළිගැනේ. ඔබ එකඟ වන්නෙහිද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

07. ඇමරිකානු සිවිල් සේවයේ, මූලික ලක්ෂණ පැහැදිලි කරන්න.

08. 1854 නෝර්ත් - කෝට් ට්‍රෙවලියන් කොමිෂමේ මූලික අරමුණ වූයේ, වැඩවසම් ක්‍රමයකට ගැලපුනු බ්‍රිතාන්‍ය සිවිල් සේවය ධනවාදී අවශ්‍යතාවයන්ට අනුව ප්‍රතිසංවිධානය කිරීමයි. විමසන්න.

09. ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමයේ, වාසි අවාසි පිළිබඳ විවේචනාත්මක රචනයක් ලියන්න.

10. පහත සඳහන් **ඕනෑම දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. ප්‍රංශ සිවිල් සේවයේ, කොන්සල් ඩි ඇට් හෙවත් රාජ්‍ය උපදේශක සභාව.
2. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සභා ක්‍රමය.
3. 1978 ව්‍යවස්ථාවට කරන ලද 19 ව්‍යවස්ථා සංශෝධන සහ ස්වාධීන කොමිෂන් සභා.
4. පංචායත් සමිති සහ ඉන්දියාවේ සහභාගීත්ව සංවර්ධනය.